**1.** **තනතුර - උපදේශන සහකාර (පුනරුත්ථාපන)**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමකින් පහත දැක්වෙන ක්ෂේත්‍රයකින් ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (අවම වශයෙන් එක් ක්ෂේත්‍රයකින් එක් ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු වේ.)

i. උපදේශනය
ii. ඖෂධ අනිසි ලෙස භාවිත කළමනාකරණය
iii. මනෝ විද්‍යාව
iv. සමාජ විද්‍යාව

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - MA 2-2 2025

මූලික වැටුප - රු. 46,960.00 (2026), රු. 50,540.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 46,960.00 + 17800.00 x12 = රු. 777,120.00 (2026)

50,540.00 + 17800.00 x 12 =රු. 820,080.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. පුනරුත්ථාපනය වන අයවලුන්ගේ ප්‍රශ්න ගැටලු හඳුනා ගැනීම/ විමර්ෂනය/ තොරතුරු හා දත්ත රැස් කිරීම / විශ්ලේෂණය තුලින් සුදුසු විසඳුමක් කරා යාමට අවැසි මාර්ගෝපදේශන සේවා සැපයීමට සහාය වීම.

ii. පුනරුත්ථාපනය සඳහා කාර්යාංශ වෙත යොමු කරනු ලබන අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූ පුනරුත්ථාපනලාභීන්ගේ මානසික හා කායික තත්ත්වයන් පිළිබද නිවැරදි තක්සේරුවකින් පසු ඔවුන් යහ මගට ගැනීමට හා අන්තරායකර ඖෂධ සඳහා වන ඇබ්බැහිය වැලැක්වීම සඳහා උපදේශන නිළධාරීගේ අධීක්ෂණය යටතේ සුදුසු උපදේශනයන් ලබාදීම

iii. පුනරුත්ථාපනය වන අභ්‍යාසලාභින්ගේ ව්‍යාකූල තත්ත්වයත් විශ්ලේෂණය තුළින් පුනරුත්ථාපනලාභින් සඳහා උපදේශන නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ අවශ්‍ය වන තනි පුද්ගල හෝ කණ්ඩායම් උපදේශනයන් සැලසුම් කිරීම.

iv. පුනරුත්ථාපනලාභින්ගේ උපදේශනයන් පිළිබඳ නිවැරදි සියලුම දත්ත හා ලිපිලේඛණ නිසි පරිදි නඩත්තු කිරීම, එම දත්ත ආශ්‍රයෙන් සතිපතා, මාසිකව ඔවුන් පිළිබඳ ඇගයීම් සිදු කිරීම හා එම දත්තයන් ආරක්ෂාකාරීව සුරැකිම.

v. අභ්‍යාසලාභින්ගේ මානසික හා කායික සුවය සඳහා අවැසි සුබසාධක කටයුතු පිළිබඳ අවධානය යොමු කරමින් සාර්ථක පුනරුත්ථාපනයක් සඳහා සහාය දැක්වීම.

vi. පුනරුත්ථාපනලාභින්ගේ සුබසිද්ධිය සඳහා සුදුසු වෘත්තීය ක්‍රම උපායන් හඳුනා ගැනිම හා ඒ සඳහා සුදුසු මාර්ගෝපදේශනයන් උපදේශන නිළධාරී වෙත යොමු කිරීම.

vii. පුනරුත්ථාපනලාභීන්ගේ මානසික තත්ත්වය සහ අවශ්‍යතාවය පරිදි සමාජ/ සංස්කෘතික/ ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

viii. සියලුම පුනරුත්ථාපනලාභීන්ගේ චර්යාවන් අධ්‍යනය කර ඔවුන් පිළිබඳව අවශ්‍ය ප්‍රගති වාර්ථා නිසි කලට ලබාදීම සහ පුනරුත්ථාපනලාභීන් පිළිබඳව අවශ්‍ය සියළුම වාර්ථාවන් නිසි පරිදි නඩත්තු කිරීම.

ix. අවශ්‍යතාවය අනුව පුනරුත්ථාපනලාභීන් පිළිබඳ තොරතුරු වෛද්‍යවරුන්, මනෝ චිකිත්සකයින් වැනි වෘත්තිකයින්ට උපදේශන මූලධර්මයන්ට අනුකූලව ලබා දීම.

x. සමාජගතවන පුනරුත්ථාපනලාභීන් සඳහා පවුල් උපදේශනයන්, උපදේශන නිළධාරිගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම.